වෙළඳ දැන්වීම

1.තරුණයෙක් විසින් තම ගැහැණු ළමයාව පළවෙනි වරට තම නිවසට රැගෙන එයි.

(මෙහිදී තරුණයා සුදු පැහැති අත් දිගු කමිසයකින් සහ ගුරු පැහැති කලිසමකින් සැරසී සිටින අතර ඔහු ඉතා කඩවසම් ස්වරූපයක් උසුලයි.නිවස ද සුදු පැහැති වන අතර සුදු පැහැති තිර රෙදි වලින් ආලංකාර කර ඇත- මෙහිදී සුදු පැහැ යොදා ගැනීමට ප්‍රධානම හේතුව වන්නේ එතුලින් මෙම සන්නාමය සතුව ඇති සම්භාව්‍ය බව ඉස්මතු කිරීමට හැකියාවක් ලැබීමයි)

මෙහිදී යුවතිය සුදු පැහැති සල්වාර් ඇඳුමකින් සැරසී සිටින අතර ඇය දමිළ පෙනුමතිය.

තරුණයා විසින් ගැහැණු ළමයාව අතින් ඇදගෙන ඉදිරියට දුවගෙන යයි. මෙම අවස්ථා වේදී තරුණයාගේ සහ තරුණියගේ මුහුණෙහි ඉතාමත් සතුට ස්වරූපයක් දැක ගත හැකිය.

2.එලෙස දුවගෙන විත් ඔවුන් නවතින්නේ සුදු පැහැයෙන් පින්තාරු කරන ලද ඉතාමත් සුන්දර පැන්ට්‍රියක් අසලය. තරුණයාවිසින් ඉන්පසුව ඇයව පැන්ට්‍රියට හේත්තු කරයි. ඒත් සමගම ඇගේ කරෙහි දමාසිටි ශෝලය ගිලිහී බිම වැටීමට යයි.

ඔහු විසින් එම ශෝලයගෙන ඇයව පැන්ට්‍රි කබඩය දෙසට හරවාඇයගේ පිට ඔහුගේ පපුවට හේත්තු කරගෙන ඇයගේ දෑස් අර ශෝලය භාවිතා කරමින් ගැටගසයි.

ඉන්පසුව එතනම ඇති පුටුවක ඇයව වාඩි කරවයි.

ඉන්පසු ඔහු විසින් Zesta පැකට්ටුවක් විවෘත කර තේ සෑදීම ආරම්භ කරයි.( මෙහිදී තේ සෑදීමේ ක්‍රියාවලියේ ස්වභාවික හඬ එනම් පැකට්ටුව විවෘත කිරීමේ හඬ තේ කෝප්පයට වත් කිරීමේ හඬ වැනි හඬවල් ඔප් නැංවීමට කටයුතු කළ යුතුය- පාරිභෝගිකයන්ට නිෂ්පාදිතය භාවිතා කිරීම සම්බන්ධව ස්වභාවික අත්දැකීම ලබාදීමට මෙමගින් හැකිය.)

2.තේ සාදා අවසන් වූ ඔහු පැන්ට්‍රිය මත තිබූ හැන්දගෙන එම හැන්ද යුවතියගේ අතෙහි පහළ සිට ඉහළට ස්පර්ශ කරමින් පැමිණේ.

එයින් යුවතිය තිගැස්සී යයි.

තිගැස්සීමත් සමගම යුවතියගේ කණ දෙසට නැමී තරුණයා

" විශ්වාසයි නේද" ලෙසින් විමසයි.

ඒත් සමගම යුවතිය හැකිලී ගොස්

"ම්ම්ම් මටත් වඩා" ලෙසින් පවසයි. (මෙහිදී මෙම විශ්වාස යන සංකල්පය මගින් ඔප්නෑවීමට උත්සාහ කරන්නේ නිෂ්පාදිතයේ ගුණාත්මක භාවය සහ පාරිභෝගිකයන් අතර එම නිෂ්පාදිතය පිළිබඳව තිබෙන්නාවූ විශ්වාසවන්තභාවයයි)

3.ඒත් සමගම තරුණයා පැන්ට්‍රිය මත තිබූ Zesta ලාංඡනය සහිත තේ කෝප්පයක් ගෙන එය යුවතියගේ කන අසලට මදක් ලන්කොට එම කෝපයට දෙවරක් හැන්දෙන් තට්ටු කරයි.

ඒත් සමගම යුවතිය

"ම්ම්ම්හ්හ් Zesta"

ලෙසින් පවසයි. (මෙහිදී යුවතියගේ මුහුණෙහි ඇයගේ දෑස් බැඳ තිබුණද එම හඬින් ඇය එම නිෂ්පාදිතය හඳුනාගත් බවට ඉඟි තිබිය යුතුය)